www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යාපනයේ සිසු ගැටුම යොදාගෙන උතුරේ මිලිටරිය ශක්තිමත් කිරීමේ උද්ඝෝෂණයක් සහ සිසු දඩයම තීව්‍ර කිරීමේ තැතක්

**ප්‍රදීප් රාමනායක විසිනි**
**2016 අගෝස්තු 11**

යාපනය විශ්වවිද්‍යාලයේ සිසුන් දෙපිරිසක් අතර පසුගිය දා ඇති වූ ගැටුම මුල් කරගෙන උතුරේ මිලිටරිය ශක්තිමත් කිරීමටත් වර්ගවාදී පදනමක පිහිටා විශ්වවිද්‍යාල තුල සිසු දඩයම උග්‍ර කිරීමටත් මෛත්‍රීපාල සිරිසේන-රනිල් වික්‍රමසිංහ ආන්ඩුව පියවර ගෙන තිබේ.

යාපනය විශ්වවිද්‍යාලය තුල සිසුන්ට එරෙහිව පෙර සිටම ඔත්තු බැලීමට යොදවා සිටි "සිවිල් පොලිස් නිලධාරීන්ට අමතරව නිලධාරීන් විශාල සංඛ්‍යාවක් යොදා ඇති" බව සහ "සිංහල සිසුන්ට ආරක්ෂා සැපයීම සඳහා බුද්ධි අංශ නිලධාරීන් ද යොදා ඇති" බව පොලිස්පති පූජිත ජයසුන්දර පසුගිය දා මාධ්‍යයට ප්‍රකාශ කර තිබුනි. යාපනය විශ්වවිද්‍යාලය තුල එවන් සිවිල් පොලිස් ඔත්තුකරුවන් සිටින බව රජය විසින්ම එලිදරව් කෙරී ඇත්තේ ප්‍රථම වතාවට ය. කෙසේ වුවද, එය යාපනයට පමනක් සීමා විය නොහැකිය.

විශ්වවිද්‍යාලයේ සිංහල සහ දෙමල සිසුන් දෙපිරිසක් අතර සිදුවූ ගැටුමට මුල් වූයේ, නවක සිසුන් පිලිගැනීමට ජූලි 16 වෙනිදා සංවිධානය කර තිබූ උත්සවයකට පූර්ව එකඟතාවයකින් තොරව සිංහල ශිෂ්‍ය සංගමය විසින් උඩරට නර්තනයක් අතුලත් කිරීම හේතු කොට ගෙන ඇතිවූ මත භේදයකි. සිංහල වර්ගවාදී නඩ සහ ධනපති මාධ්‍ය සංස්ථාපිතය මෙම සිද්ධිය දෙමල සිසුන්ට විරුද්ධව උමතු වර්ගවාදයක් ඇවිස්සීමට ක්ෂනිකව යොදාගත් අතර සිංහල සිසුන්ගේ ආරක්ෂාව තර කරන ලෙස ආන්ඩුවෙන් සහ ආරක්ෂක අංශවලින් ඉල්ලා සිටියහ. සිසු ගැටුම සහ වර්ගවාදීන්ගේ උද්ඝෝෂනය, ශිෂ්‍යයන් ට එරෙහි මර්දනය තීව්‍ර කිරීම සඳහා මෙම අවස්ථාව ආන්ඩුව සහ ආරක්ෂක අංශ විසින් වහාම ඩැහැ ගෙන ඇත.

ආන්ඩුව විශ්විද්‍යාල සිසුන්ට විරුද්ධව මෙවන් මර්දනකාරී සැලැස්මක් පෙරට දමා ඇත්තේ, අධ්‍යාපනය ඇතුලු සමාජ සුභසාධන කප්පාදුවට සහ ප්‍රජාතාන්ත්‍රිය අයිතීන් මැඩලීමට එරෙහිව විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් අතර වැඩෙන විරෝධය හා රැඩිකලීකරනය තලා දැමීමේ හා කම්කරු පන්තියට විරුද්ධව වාර්ගිකභේදකරනය අලුත් වටයකින් ඉස්මත්තට ගැනීමේ අරමුන ඇතිව ය.

යාපනය විශ්වවිද්‍යාලයේ සිසු ගැටුම, සිංහල සිසුන් යොදාගෙන හමුදාවේ පිටුබලය සහිතව දෙමල සිසුන්ට එරෙහි කාලයක් තිස්සේ සුදානම් කෙරුන දැනුවත් වර්ගවාදී ප්‍රකෝපකරනයක ප්‍රතිඵලයකි. යුද්ධය අවසන් වීමෙන් පසු මෑත වසර කිහිපය තුල විශ්වවිද්‍යාලයට ඇතුලත් කෙරුනු සිංහල ශිෂ්‍ය සංඛ්‍යාව කැපී පෙනෙන ලෙස ඉහල ගොස් ඇත. උදාහරන වශයෙන් විද්‍යා පීඨයේ සිංහල ශිෂ්‍ය ප්‍රතිශතය සියයට හැටක් දක්වා වැඩි කෙරී ඇත. එම තත්වය ද ප්‍රයෝජනයට ගනිමින් විශ්වවිද්‍යාලය තුල "සිංහල සංගමය" නමින් ශිෂ්‍ය සංවිධානයක් පිහිටුවා ගෙන තිබේ. ඒ දක්වා යාපනයේ හෝ වෙනත් විශ්වවිද්‍යාලයක වාර්ගික පදනමක වෙන ම ශිෂ්‍ය සංගම් පිහිටුවීමේ සම්ප්‍රදායක් හෝ නැඹුරුවක් තිබුනේ නැත.

වෙන ම සිංහල ශිෂ්‍ය සංවිධානයක් පිහිටුවීමට සමපාතව සිංහල බෞද්ධ ක්‍රියාකාරකම් ද සිදු කෙරී ඇත. විවිධ බාධා මධ්‍යයේ සිදුකෙරුනු අහිංසක ක්‍රියාකාරකම් ලෙස හුවා දක්වන මෙම ප්‍රකෝපකරනයන් ට හමුදාවේ සහය ලැබුන බව දැන් එලිදරව් වී තිබේ.

විශ්වවිද්‍යාලය තුල සංවිධානය කල බෞද්ධ උත්සව වල සැරසිලි සහ ඉදිකිරීම් සඳහා කායික සහ මූල්‍ය ආධාර හමුදාව විසින් ලබා දී ඇත. එමෙන් ම ප්‍රදේශයේ පිහිටි මිලිටරි ආපනශාලාවකින් සිංහල සිසුන්ට අඩු මුදලට ආහාර සැපයින. මෙම වැඩකටයුතු හරහා ඇතැම් සිංහල ශිෂ්‍ය කන්ඩායම් සහ මිලිටරිය අතර සමීප සම්බන්ධකම් ඇති වී තිබූ අතර හමුදා නිලධාරීන් මුනගැසීම සඳහා ඔවුන් ස්ථානගතව සිටින ප්‍රදේශවලට ඔවුන්ගේ යෑම් ඊම් ද නිරන්තරව කෙරී ඇත. යුද්ධය තුලත් ඉන් පසුවත් මර්දන යාන්ත්‍රනයක් ලෙස තමන් මත පලාතේ දෙමල මහජනතාව මත ක්‍රියාත්මක වන හමුදාව සමග සිංහල ශිෂ්‍යයන්ගේ මෙම සම්බන්ධතා කලක් තිස්සේ දෙමල සිසුන්ගේ නොරිස්සුමට හේතු වී තිබුනි. සිංහල සංගමය විසින් ඊනියා රන විරුවන් සැමරීමේ කොලඹ උත්සවයට සමගාමීව මැයි මාසයේ යාපනය විශ්වවිද්‍යාලය තුල වර්ගවාදී යුද ජයග්‍රහනය සැමරීම තුලින් මෙම වාර්ගික ඇවිස්සීම වඩා ඉස්මත්තට ගැනුනි.

විද්‍යා අංශයේ නවක සිසුන් පිලිගැනීමේ උත්සවයේ ආරාධිතයන් කැඳවාගෙන එන පෙරහැරට උඩරට නර්තනයක් ඇතුලත් කිරීම අවශ්‍ය බවට සිංහල ශිෂ්‍ය සංගමය ඉල්ලා ඇත්තේ ප්‍රකෝපකරනයන් මාලාවක් හරහා වාර්ගික ආතතීන් තීව්‍ර වී තිබූ තතු තුලය.

උත්සවයට පෙරදිනයේ විද්‍යා අංශයේ පීඨාධිපති සමඟ සිසුන් දෙපිරිස කල සාකච්ඡාවේදී තීරනය කෙරී තිබුනේ, මෙම වසරේ නවක සිසුන් පිලිගැනීමේ පෙරහැර සඳහා දෙමල සංස්කෘතිකාංග පමනක් ඇතුලත් කෙරන බව සහ ලබන වසරේ සිංහල හා දෙමල සංස්කෘතිකාංගවල එකතුවක් ඊට අඩංගු කිරීමට පියවර ගැනෙන බවයි.

එනමුදු, පසුවදා පැවති එකී පෙරහැරට, උඩරට නර්තනයක් ඇතුලු කිරීමට සිංහල සංගමය උත්සාහ කලේ එම එකඟතාවය හිතා මතාම කඩ කරමිනි. ගැටුම ඇති වූයේ දෙමල සිසුන් කන්ඩායමක් ඊට විරෝධය පෑමත් සමගය. ගැටුමෙන් තුවාල ලැබූ සිංහල සිසුන් හය දෙනෙකු පොලිස් ආරක්ෂාව යටතේ රෝහල්ගත කෙරුනි. නර්තනාංගය සඳහා බෙර වාදන සැපයීමට යොදා තිබුනේ හමුදා සොල්දාදුවෙකු බව පසුව වාර්තා විය.

ගැටුම පිලිබඳ "පරීක්ෂන" පැවැත්වීමට පොලීසිය යොදා ඇති අතර සිංහල සිසුන් කිහිප දෙනෙකුගේ පැමිනිල්ලක් මත අත්අඩංගුවට ගැනුනු යාපනය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය සංගම් සභාපති දැඩි ඇප කොන්දේසි මත නිදහස් කර ඇත. අධිකරනය ගැටුමට සම්බන්ධ බවට සැලකෙන සිසුන් හත් දෙනෙකුට නොතීසි නිකුත් කර තිබේ.

ආන්ඩුව, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂගේ නායකත්වය සහිත ඊනියා ඒකාබද්ධ විපක්ෂය සහ මාධ්‍ය සංස්ථාපිතය ගැටුමට තුඩු දුන් සැබෑ හේතු වසන් කරමින් උතුරේ හමුදා බලය තර කිරීමේ උද්ඝෝෂනයට යලි පන පොවා ඇත.

ජූලි 25 වනදා දිවයින පුවත්පතේ පලකෙරී තිබුන යාපනය විශ්වවිද්‍යාලයේ සිංහල සංගමයේ තුෂාර නමැති ශිෂ්‍යයෙකු ලබාදුන්නේයැයි කියන සම්මුඛ සාකච්ඡාව ඊට එක නිදසුනකි. ඔහු මෙසේ පවසයි:

"කැම්පස්එකේ ආරක්ෂාව තහවුරු කරලා ස්ථිර විසඳුමක් දෙනකම් සිංහල ලමයි කවුරුවත් යාපනය කැම්පස් එකට යන්නේ නැහැ. අපි කියන්නේ යාපනය කැම්පස් එක වටේටම ආමි එක දාන්න කියලයි. ඒ දෙමල ලමයි පොලිසියට බයත් නෑ. එයාල ආමි එකට සෑහෙන බයක් තියෙනවා."

ඒ අතර "යාපනය විශ්වවිද්‍යාලයේ අගතියට පත් සිසුන්ගේ දෙමාපිය සංසදය" ලෙස පිහිටුවාගෙන ඇති සංවිධානය විසින් ද මාධ්‍ය සාකච්ඡාවක් පවත්වමින් පවසා සිටියේ විශ්වවිද්‍යාලය අභ්‍යන්තරයේ හා ඉන් පිටත ආරක්ෂාව තහවුරු කෙරෙනතුරු සිය දරුවන් විශ්වවිද්‍යාලයට නොයවන බවයි.

විශ්වවිද්‍යාලයේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අවශ්‍ය සෑම පියවරක් ම ගන්නා බවට ජනාධිපති සිරිසේන සිංහල ශිෂ්‍යයන් ට හා ඔවුන්ගේ දෙමව්පියන්ට සහතික වී ඇත. විශ්වවිද්‍යාල සිසු ගැටුම නිමිත්තක් කර ගනිමින් උතුරේ හමුදා බලය තර කිරීමේ උද්ඝෝෂනය පෙරට ගෙන ඇත්තේ, තම ජන ජීවිතය සෑම පැත්තකින් ම පීඩාවට පත් කරන හමුදාව උතුරෙන් හා නැගෙනහිරින් ඉවත් කරන ලෙස එම පලාත්වල දෙමල හා මුස්ලිම් ජනතාවගෙන් කෙරෙන ඉල්ලීමට පරිපූර්නව හතුරුව ය.

හමුදා මූලස්ථාන නවීකරනය කර ශක්තිමත් කිරීම, යුද ස්මාරක සවිකරමින් හමුදාවේ 'ප්‍රතිරූපය නඩත්තු කිරීම' මෙන් ම බලහත්කාරයෙන් හමුදාව යටතට පවරා ගෙන ඇති ඉඩම් වල කෘෂි වගාවන් සහ නොයෙකුත් ව්‍යාපාර පවත්වාගෙන යාම ද ප්‍රධාන මංසන්ධි වල මෙන්ම හින්දු ආගමික ස්ථාන පිහිටි බිම්වල පවා බෞද්ධ සිද්ධස්ථාන ඉදිකරමින් වර්ගවාදී ආතතිය අවුලුවා තබා ගැනීම ද හමුදාව විසින් කරනු ලබයි. එමෙන් ම දෙමල ජනයාට අයිති ඉඩම් වල සිංහල ජනයා පදිංචි කිරීමේ ව්‍යාපෘතියක් ද ආන්ඩුව විසින් පටන් ගෙන ඇත.

සමාජවාදය සහ වාර්ගික සමානතාවය ගැන බොරු මවාපෑම් කරන අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමන්ඩලය (අවිශිබම) සහ ඊට නායකත්වය දෙන ව්‍යාජ වාම පෙරටුගාමී සමාජවාදී පක්ෂය (පෙසප) දෙමල සිසුන්ට එරෙහි මෙම වර්ගවාදී ප්‍රකෝපකරනය සාධාරනීකරනය කිරීමේ කුහක තැනක යෙදී සිටිති.

සිද්ධිය සම්බන්ධයෙන් අදහස් දැක්වීමට පෙසප කැඳවූ මාධ්‍ය සාකච්ඡාවක දී එහි නායකයෙකු වූ දුමින්ද නාගමුව ප්‍රකාශ කලේ යුද්ධයේ අනිසි විපාක තුලින් ඇතිකල "ජාතිවාදී මනෝභාවය" මෙම ගැටුමට හේතු වූ බව යි. එවන් මනෝභාවයක් විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් අතර පවතී නම් එවැන්නක් වගා දිගා කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු සංවිධාන අතරින් සිංහල ස්වෝත්තමවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) ප්‍රධාන තැනක් ගනී.

රාජපක්ෂ බලයට දමා ගැනීමේ උද්ඝෝෂනයේ දී සහ වර්ගවාදී යුද්ධයේ දී කසකරුවන් ලෙස ක්‍රියා කල ජවිපෙ තුල පෙසප නායකයෝ ලැග සිටියහ. දැන් පෙසප යටතේ පවතින අවිශිබම එකල ක්‍රියාත්මක වූයේ ජවිපෙ අන්ඩක් ලෙසිනි. ජවිපෙ විසින් 1987-90 කාල පරිච්ඡේදයේ කල වර්ගවාදී මැරකම්, ඝාතන සහ ප්‍රකෝපකරනයන් ට අවිශිබම ක්‍රියාකාරීන් සම්බන්ධ වූ බව රහසක් නොවේ.

ඒ සමගම, දෙමල ජාතික සන්ධානය ඇතුලු දෙමල ධනපති සහ සුලු ධනපති සංවිධාන විසින් වගාදිගා කෙරෙන දෙමල ජාතිකවාදී ප්‍රතිගාමී දෘෂ්ටි ආස්ථානයන් ද සිසුන් අතර වාර්ගික ආතතීන් වැඩි දියුනු කිරීම සඳහා මූලික ක්‍රියාකලාපයක් ඉටු කරයි.

යාපනයේ සිසු ගැටුමට තුඩුදුන් ආන්ඩුවේ සහ මිලිටරියේ ප්‍රකෝපකරනයන් ද සිංහල මෙන්ම දෙමල වර්ගවාදී සහ ජාතිකවාදී නඩවල ප්‍රතිගාමී දෘෂ්ටිවාදයන් ද මුලුමනින්ම වහංගු කල නවගමුව ගැටුමේ වගකීම දෙමල ශිෂ්‍යයන් මත පැටවූයේ "ගැටුම් වලක්වා ගැනීමට දෙමල ශිෂ්‍යයන්ට විශේෂ වගකීමක් පැවරෙන" බව පවසමිනි.

© www.wsws.org